

# අධ්‍යාපන චාරිකාව



එච් ජී ලව්නා ජයිනි
3 වසර
ලැගුම්දෙනිය කණිෂ්ඨ විද්‍යාලය



# අධ්‍යාපන චාරිකාව

එච්. ඒ. ලවීනා ජයිනි අධිභාෂිනී

---- කතෘ ---

කතෘගේ වෙනත් කෘති

මා ගිය චාරිකා පොජ්ජ

ISBN - 978-624-208-711-5

ලැගුම්දෙණිය ප්‍රාථමික විදුහල

3 ශ්‍රේණිය

2025-02-04

# පිදුම

මගේ පාසල වන ලැගුම්දෙණිය ප්‍රාථමික විදුහලේ විදුහලේ විදුහල්පති තුමන්ගේ මූලිකත්වයෙන් අපව අධ්‍යාපන චාරිකාවක් කැටුව ගියා. දැනුම සතුට විනෝදය පිරුණු එදින හරිම සුන්දර දවසක් විදුහලේ ගුරු මැණිවරු සියළු දෙනාද චාරිකාව සඳහා සහභාගි වුණා අපි ගිය ඒ ලස්සන තැන් ගැන මා චිත්‍ර ඇඳලා කවි ලියලා පොත් පිංචක් හැදුවා.

ඉතිං මේ වසරේ මහාමායා බාලිකාවේ **E-Book** එලි දක්වන උත්සවයට මම මේ පොතඉදිරිපත් කරනවා. මට හමදාම පොත් ලියන්න උදවු කරන සෙනවිරත්න ගුරුපියානන්ට මාගේ විශේෂ ස්තුතිය පුද කරන අතර මාගේ දෙමාපියන්ටහා පන්ති භාර ගුරු මෑණියන් වන නිලන්ති ගුරුතුමියට හා මාගේ ගමනට දිරි දෙන ඔබ සියළු දෙනාට මාගේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිමි.

ලවිනා ජයිනි

# පෙරවදන


සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝදමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිද්ධවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන .හෝ[illegible] ගත්කරණී .ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලාතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සදහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය

විදුහල්පතිනිය
ශශිකලා සේනාධීර
මහාමයා බාලිකා විද්‍යාලය
මහනුවර

උදේ පාන්දර ඇහැරී
පාසල් ඇඳුමින් සැරසී
යන්න හදන්නේ  අපි දැන්
නැණ ලබනා චාරිකාව




රෝස කිරිල්ලී



දැන් හැමෝම බැහැගන්නේ
ඩෝසන් කුළුනට යන්නේ
මෙය උස කුළුනක් වෙන්නේ
මහ මුහුදත් ඈත පෙනේ



මහමෙවුනාවට යමු

සුදු නෙළුමක් පුද දෙමු


සාධු සාධු සාධු කියා

බුදු සමිඳුන් නමදිමු




සරදියෙල්ගේ ගම්මානේ
දැන් අපි යන්නට ඕනේ
සරදියෙල්ගේ ඕන වැඩක්
අපිට මෙහි දකින්න ඇතේ





සතුන් ඉන්න හොඳම තැනක්
පින්නවල උද්‍යානයක්
සතුටින් අපි ගස් යට හිඳ
ගත්තේ දිවා ආහාරය





පින්නවලට අපි ගියා
අලියෝ වතුරේ නැටුවා
අලි පැටවුන් නටන ගමන්
කුංච නාද කරනවා




නොදැනී කල් ගතවුණා
චාරිකාව නිම වුනා
සැම නිවෙස් වලට ගියා
සිත සතුටින් ඉතිරුණා





## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරුභවතුන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි තම නිර්මාන ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන



ISBN - 978-624-208-711-5

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්